# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,902 — 1970 අප්‍රේල් 17 වැනි සිකුරාද — 1970.4.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 529 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 549 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 535 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 541 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 547 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 547 | විවිධ දැන්වීම ... ... ... ... | 550 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## පහළ ශ්‍රේණියේ අනියම් ලඝු ලේඛක තනතුරු වලට ඉල්ලීම් සඳහා අවශ්‍ය පෝරමය

1. නම :————.
   (අ) වාසගම :————.
   (ආ) නම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය හා 1970. 5. 8 දිනට වයස :————.

4. පියාගේ නම සහ රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.
   (අ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :—

6. (අ) ජාතිය :————.
   (ආ) යුෂ්මතා ලාංකිකයෙක් ද ? :————.
      (i) උත්පත්තියෙන් ද ? :————.
      (ii) නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද ? :————.

7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.

8. ලඝුලේඛනය හා යතුරු ලිවීමේ පළපුරුද්ද සහ දැනීම :————.

9. වෙනත් සුදුසුකම් :————.

10. චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කරන්නා වූ තිදෙනාගේ නම් :————.

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය ඒවා බවට සහතික කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව සේවයෙන් පහකිරීමට හේතු වන බවද, මම හොඳහැටි දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–487—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 79/එක්ස්. 2162/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලයයන්හි සංස්කාරක තනතුරු

උක්ත මැයෙන් අංක 14,884 හා 69. 12. 12 වැනි දින දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකර ඇති නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ. එම නිවේදනයේ 4 වැනි ඡේදයේ (ආ) අනු ඡේදයේ දැක්වෙන සුදුසුකම් පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බැවින් එම සුදුසුකම්ලත් අයට ද ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි බව දන්වමි.

**4. අවශ්‍ය සුදුසුකම්.—**

(ආ) පහත දැක්වෙන සුදුසුකම් තිබෙන බවට,

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක සිංහල/දෙමළ විෂයයක් වශයෙන් ඇති උපාධියක්, හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක පහත සඳහන් විෂයයකින් විශේෂ උපාධියක් හෝ එම විෂයයන් දෙකක් ඇතුළු සාමාන්‍ය උපාධියක්,

**විෂයයන් :** භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සත්ව විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව හා වාණිජ විද්‍යාව

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ ඊට උසස් ශාස්ත්‍රීය විභාගයකදී සිංහල/දෙමළ විෂයයෙන් සාමර්ථයක්, හෝ

සිංහල/දෙමළ මාධ්‍යයෙන් උපාධියක්

සහ

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උ. පෙ.) හෝ ඊට උසස් ශාස්ත්‍රීය විභාගයකදී ඉංග්‍රීසි විෂයයෙන් සාමර්ථයක්, හෝ

ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධියක් සමත් වී තිබීම

සහ

(iv) භාෂා පරිවර්තන වැඩ පිළිබඳව අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක්.

2. මෙම තනතුරු සඳහා ඉල්ලීමට කැමති ඉහත දැක්වෙන සුදුසුකම්ලත් අයට ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර — 1970 අප්‍රේල් මස 30 වැනිදා,

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1970 මැයි මස 6 වැනිදා.

3. අංක 14,884 හා 69. 12. 12 වැනි දින දරණ ගැසට් නිවේදනයේ අඩංගු අධ්‍යාපන සුදුසුකම් මත ඉල්ලුම් පත්‍ර එවා ඇති අය නැවත ඉල්ලුම් කිරීමට උවමනා නැත.

4. සම්පූර්ණ විස්තර සඳහා අංක 14,884 හා 69. 12. 12 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවී ඇති දැන්වීම බලනු මැනවි.

ඩී. ආ.ර් එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

4–550—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

අංක. ඊඒ/2/12

## රේගු දෙපාර්තමේන්තුව

### මෝටර් ලෝන්ච් යාත්‍රා පදවන්නන්ගේ තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ මෝටර් ලෝන්ච් යාත්‍රා පදවන්නන්ගේ තනතුරුවල ඇති ඇබෑර්තු කීපයක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වන සේ පිළියෙල කරන ලද අයදුම්පත් 1970 අප්‍රේල් මස 25 දිනට පෙර, කොළඹ ලංකා රේගුවේ ප්‍රධාන රේගු අයකැමි (පාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාළ වාර්ෂික වැටුප් ක්‍රමය රු. 960—17×72—රු. 2,184 වේ. (ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,000—17×90—රු. 4.530 වේ.)

3. **සේවයේ යෙදවීම පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික සේවා කාලයකට යටත්වය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුය.

(ii) ලෝන්ච් යාත්‍රා පදවන්නකුගේ සහතිකය ලබාගෙන තිබිය යුතුය. වැඩි අශ්ව බලයකින් යුතු ලෝන්ච් යාත්‍රා පැදවීමට අවසර ලබා ඇති අවුරුදු දෙකකට වැඩි පළපුරුද්දක් ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iii) 1970 අප්‍රේල් 25 දිනට වයස අවුරුදු 25 කට නො අඩු අවුරුදු 35 කට නොවැඩි විය යුතුය.

(iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සනීපයෙන් යුක්ත විය යුතුය.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් වලට පහත සඳහන් සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.
(iii) ලෝන්ච් යාත්‍රා පැදවීමේ බලපත්‍රය.
(iv) පළපුරුද්ද සම්බන්ධයෙන් ඇති සහතික.
(v) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

6. අයදුම්පත් මගේ පුද්ගලික නමට හෝ මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරියෙකුගේ නමට නො එවිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡේදයේ මුලින්ම සඳහන් රාජ්‍ය සේවයේ තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි ද බලනු මැනවි.

ප්‍රධාන රේගු අයකැමි.

1970 මාර්තු මස 31 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

**මෝටර් ලෝන්ච් යාත්‍රා පදවන්නන්ගේ තනතුරු සඳහා අයදුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. 1970 අප්‍රේල් 25 දිනට වයස සහ උපන් දිනය :————.
4. (i) ජාතිය :————.
(ii) ලාංකික වන්නේ උත්පත්තියෙන් ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
5. උපන් ස්ථානය :—,
(i) අයදුම්කරු :————.
(ii) අයදුම්කරුගේ පියා :————.
(iii) පියාගේ පියා :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. පළපුරුද්ද ගැන විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත් පත්වීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–480—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### සමාජ සේවා නිලධාරි තනතුරු

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III පන්තියේ සමාජ සේවා නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළිවෙල කළ යුතු ඉල්ලුම් පත්‍ර 1970 මැයි මස 2 වැනි දින හෝ ඊට පෙර කොළඹ 3, බාලදක්ෂ මාවත, ගාලු මුවදොර, සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—තනතුරට අදාල වැටුප් ක්‍රමය මෙසේය :—

III වැනි පන්තිය—රු. 2,580—120 බැගින් 11—රු. 3,900 (කාර්යක්ෂමතා කඩඉම රු. 3,060 ට පළමු).

II වැනි පන්තිය—රු. 4,080—180 බැගින් 7—රු. 5,340 (කාර්යක්ෂමතා කඩඉම රු. 4,800 ට පළමු).

I වැනි පන්තිය—රු. 5,580—240 බැගින් 5—රු. 6,780.

(III, II සහ I වැනි පන්තිවලට අයත් වැටුප් ක්‍රම අඛණ්ඩ කාල වැටුප් ක්‍රමයට අයත් ය.)

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම, පළමුවෙන් තුන් අවුරුදු ආධුනික කාලයක් මත වනු ඇත. ආධුනික කාලය අවසානයේදී තනතුරුවල ස්ථිර කිරීම ආධුනික කාලය ඇතුලත දී නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත්වීම උඩ රඳා පවතී.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත දැක්වෙන කරුණු පිළිබඳව සතුටුදායක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1970 මැයි 2 වැනි දිනට වයසින් අවුරුදු 22 ට නොඅඩු හා 35 ට නොවැඩි බව (රජයේ සේවයේ නියුක්ත ඉල්ලුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 40 කි.), සහ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව, හෝ

(ඇ) බැරිස්ටර්වරයකු හෝ ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයකු හෝ නීතිඥයකු හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම් දරණ අයෙකු බව, හෝ

(ඈ) ඉහත දැක්වූ වයස් සීමාව ඇතුලත ගැනෙන ජ්‍යෙෂ්ඨ පාඨ ශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමානවූ හෝ උසස් විභාගයක් සමත්වූද, අඩු තරමින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූද, සමාජ සේවා වැඩ සම්බන්ධයෙන් විශේෂ කෞශල්‍යයක් හෝ පළපුරුද්දක් සහ දක්ෂතාවයක් ඇති බවට තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරනු ලබන්නාවූ රජයේ සේවක යකු බව, හෝ

(ඉ) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ශුභ සාධක නිලධාරියකු වශයෙන් අවුරුදු 5 කට නොඅඩු සතුටුදායක සේවා කාල යක් ඇති ශුභ සාධක නිලධාරියකු බව (වයස සහ අධ්‍යා පනික සුදුසුකම් පිළිබඳ සැලකිල්ලක් දක්වනු නොලැබේ.).

(පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ අධ්‍යයනය පිළිබඳ ඩිප් ලෝමා සහතිකයක් සහ සමාජ සේවා වැඩ සම්බන්ධ විශේෂ පළපුරුද්දක් හා දක්ෂතාවයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

5. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානින්ට නියමිත දිනට පෙර ලැබී ඇත්නම් හා ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඒවා පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස නැත්නම් පිළිගනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් ලියවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘති පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහ තිකය හෝ පිළිගනු නොලැබේ).

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඈ) අයදුම්කරුගේ චරිතය පිළිබඳව සහ තනතුරට සුදුසු බව දැක්වෙන මෑතකදී ලබා ගන්නා ලද සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම උප ඡේදයෙන් නියමිත සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

7. තෝරා ගන්නා ලද අයදුම්කරුවකු දිවයිනේ ඕනෑම පළාතක සේවය සඳහා පත් කරනු ඇත. රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය විය හැකි ගමන් බිමන් කිරීමට ඔහුට නියම කෙරෙන අතර ඒ සඳහා පාවිච්චි කළ හැකි තත්ත්වයේ මෝටර් රථයක් හෝ අනෙකුත් අනුමත කෙරුණු වාහනයක් තබා ගත යුතු වෙයි. ගමන් වියදම් මුදල් රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

8. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධ අනිකුත් ලියකියවිලි සමාජ සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකු ගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (II) වැනි කාණ්ඩයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් වලට අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට පස් දිනක් ඇතුලත තම අයදුම් පත ලැබුණු බව දන්වා ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙයි නම් වහාම ඒ බව සමාජ සේවා අධ්‍යක්ෂ තැනට දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මෙම අවශ්‍යතාවය ඉටු කිරීමට අසමත් වුවහොත් තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අ. ම. මු. සහාබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
තැ. පෙ. 577, කොළඹ 3,
බාලදක්ෂ මාවත, ගාලු මුවදොර,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේදීය.

## ආදර්ශ අයදුම් පත

**සමාජ සේවා නිලධාරි තනතුරු**

1. සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරින් ලියන්න)
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.

2 ලිපිනය :————.

3. (අ) 1970.5.2 වැනි දිනට නියම වයස : අවුරුදු :————, මාස : ————, දින :————.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

4. ජාතිය :————.

5 (1) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පෙලපතින් ද යන වග :————.
   (2) ලාංකිකත්වය පෙළපතින් නම් පහත දැක්වෙන අය උපන් තැන් දන්වන්න—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුය.)
   (අ) යුද හමුදාවන්හි සේවය කර ඇත්නම් එම සේවා කාලය :———— සිට ———— දක්වා.
   (ආ) සහාය ගිනිනිවන සේවා, ගගනප්‍රහාර නිවාරණ සේවාව හෝ මහජනාරක්ෂක සේවාව ආදියෙහි අඛණ්ඩව සම්පූර්ණ කාල සේවයෙහි යෙදී ඇත්නම් එම සේවා කාලය :———— සිට ———— දක්වා.

8 ඔබට චතුර ලෙස මෙම භාෂාවන් කථා කළ හැකිද ?
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

9. ඔබට මෙම භාෂාවන් කියවීමට සහ තැත්නම් ලිවීමට හැකිද ?
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

10. ඔබ යෙදී ඇති රැකියාවන් ආදියෙහි විස්තර දෙන්න. පහත සඳහන් රැකියාවල ඔබේ ස්වාමියාගේ නම සඳහන් කරන්න.
   (අ) දැන් කරන රැකියාව :————.
   (ආ) පාසැලින් හෝ විද්‍යාලයෙන් අස්වීමෙන් පසු කරන ලද අනිකුත් රැකියාවන් :————.
   (ඔබ තනතුරට සුදුසු වන්නේ ගැසට් නිවේදනයේ 4 (ඇ) ඡේදය යටතේ නම් රජය යටතේ කර ඇති සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර කාල සීමාවන් ද ඇතුළුව සඳහන් කළ යුතුය.)

11. සමාජ සේවා වැඩ පිළිබඳ ඔබ ලබා ඇති පළපුරුද්ද කුමක්ද ? : ————.

12. සමාජ ආරක්ෂණ සේවා තැත්නම් සමාජ ආධාර ක්‍රම පිළිබඳ ඔබට යම්කිසි දැනුමක් තිබේද ? ඇත්නම් විස්තර දෙන්න : ————.

13. ඔබට ගමන් බිමන් පිළිබඳ පළපුරුද්ද තිබේද ?
   (අ) දිවයින තුළ :————.
   (ආ) පිටරට :————.

14 ඔබේ ඉල්ලුම් පත්‍රයට ආධාර වශයෙන් ඔබ සඳහන් කිරීමට අදහස් කෙරෙන විශේෂ හිමිකම් පිළිබඳ විස්තර සඳහන් කරන්න.

15. ඔබේ හැකියාවන් සහ චරිතය පිළිබඳව විමසනු ලැබිය හැකි උසස් පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.

16. අමුණා ඇති සහතික දුන් අයගේ නම් සඳහන් කරන්න.

**සැලකිය යුතුයි.**—මෑතකදී ලබාගත් සහතික දෙකක පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණන්න.

————,
අයදුම්කරුගේ අත්සන.

**දිනය** :————.

**4–489—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය**

---

අංකය : විආ/4/94.

### අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

**1971-72 මැලේසියානු පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව**

1971 මැයි මස සිට පහත සඳහන් ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ හෝ සඳහා මැලේසියානු රජය විසින් පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

කලා විෂයයන්
විද්‍යා විෂයයන්
වෛද්‍ය විද්‍යාව
කෘෂිකර්මය
ඉංජිනේරු විද්‍යාව
ආර්ථික විද්‍යාව හා පරිපාලනය
අධ්‍යාපන විද්‍යාව.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් වර්ෂ දෙකක් වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ මැලේසියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.
(ii) 1971.1.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.
(iii) යටත් පිරිසෙයින්, හැදෑරීමට අදහස් කරන පාඨමාලාවට උචිත වන සේ පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුය (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් පත් භාරගනු නොලැබේ.)
(iv) ඉංග්‍රීසි භාෂාවෙහි උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971.1.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2.**—එසේ ම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවක යන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) මැලේසියානු අධිකාරීන් විසින් පිළියෙල කරන පරිදි ඉතා කෙටි මගින් මැලේසියාවට යාම සහ ආපසු පැමිණීම සඳහා සංචාරක පංතියේ මුහුදු හෝ ගුවන් හෝ ගමන් පහසුකම් (ශිෂ්‍යත්වධාරියා කැටුව යන ඔහුගේ භාර්යාව හැර වෙනත් යැපෙන්නන් සඳහා වියදම් ප්‍රදානයට ඇතුළත් නොවේ.)

(ආ) අනුමත කරන ලද ඉගැන්වීමේ ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු.

(ඇ) මාස්පතා කොටස් වශයෙන් ගෙවනු ලබන මැලේසියානු ඩොලර් 6,000ක වාර්ෂික යැපීම් දීමනාවක්.

(ඈ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 150 ක දීමනාවක්.

(ඉ) මැලේසියාව ඇතුළත අනුමත කළ ගමන් සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 200ක දීමනාවක්.

(ඊ) භාර්යාව කැටුව යන විවාහක පිරිමි ශිෂ්‍යත්වධාරීන් සඳහා වර්ෂයකට මැලේසියානු ඩොලර් 1,200 ක අතිරේක විවාහක දීමනාවක්. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන අවස්ථාවේ අයදුම්කරු විවාහකව සිටියේ නම් මිස ශිෂ්‍යත්ව කාලයේ ප්‍රථම වර්ෂය තුළදී මේ දීමනා ගෙවනු නොලැබේ. එසේ ම, භාර්යාව ශිෂ්‍යත්වයක් දරන්නී නම් හෝ, මැලේසියාවේ වැටුප් ලබන රැකියාවක යෙදී සිටින්නී නම් හෝ මේ දීමනා ගෙවනු නොලැබේ.

(උ) ශ්‍රව්‍ය ආධාර, ඇස්කන්නාඩි හා මොනයම් අන්දමක හෝ දන්ත ප්‍රතිකාර හැර අනුමත කළ වෛද්‍ය හා ආරෝග්‍යශාලා වියදම්.

**සංලක්‍ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවක යන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධ යෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් මැලේසියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනු කූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම් බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

**7. වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් මැලේසියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්‍ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එසින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්‍ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්‍ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන් ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්‍ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දම කින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන් ම එම අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතා වන් සියල්ල සෑම ආකාරයෙන් ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතිය පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970.5.2 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන් ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්ත මේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතන වල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් එවිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස් කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අප්‍රියෙල් මස 9 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

4–565—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

(බී) ගණිත පාඨමාලාව සඳහා

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී—

(අ) ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය යන විෂයයන් අතුරෙන් දෙකක්, හෝ

(ආ) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව සඳහා සාමාර්ථ්‍යයක් ද ඉහත සඳහන් විෂයයන් තුනෙන් එකක් සඳහා සම්මාන සාමාර්ථ්‍යයක්, හෝ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාහයේ දී ශුද්ධ ගණිත යෙන් හෝ ව්‍යාහාරික ගණිතයෙන් සාමාර්ථ්‍යයක්.

(සී) විද්‍යා පාඨමාලාව සඳහා

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී—

(අ) ගණිතය සමඟ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිදවිද්‍යාව, සත්වවිද්‍යාව, ජීවවිද්‍යාව, යන විෂයයන් අතුරෙන් විෂයයන් තුනක්. එහෙත් උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව සමඟ ජීව විද්‍යාව පිළිගනු නොලැබේ. මෙම විෂයයන්ගෙන් එකක් සඳහා සම්මාන සාමර්ථ්‍යයක් තිබිය යුතුය, හෝ

(ආ) භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ලබන ලද සාමර්ථ්‍යයන්.

(ඩී) හස්ත කර්මාන්ත පාඨමාලාව

පිරිමින් සඳහා.—පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් සාමර්ථ තුනෙන් දෙකක්—

(අ) ලී වැඩ සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ආ) ලෝහ වැඩ සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ඇ) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක්.

කාන්තාවන් සඳහා.—පහත සඳහන් සාමර්ථ තුනෙන් දෙකක්—

(අ) විවීම සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ආ) මැටි ශිල්පය සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ඇ) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම හෝ චිත්‍රකර්මය සඳහා සාමර්ථ්‍යයක්.

සටහන.—(1) අධ්‍යයන පොදු සහතික පත්‍රයක හෝ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයක අදාළ කර්මාන්තය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් වෙනුවට ලංකා කාර්මික විද්‍යාලයයේ කර්මාන්ත ගුරු සහතිකය හෝ අවශ්‍ය කර්මාන්තය පිළිබඳව රජයේ ලලිත කලායතනයේ තුන් අවුරුදු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම නිසා දෙනු ලබන සහතිකය පිළිගනු ලැබේ. එහෙත් මෙම සහතික ඉහත 7 (V) වැනි ඡෙදයේ දී ඇති සාමාන්‍ය අවශ්‍යතාවන් වන විෂයයන් හය හෝ පාඨශාලා සහතිකය සම්පූර්ණ කිරීම සඳහා හෝ පිළිගනු නොලැබේ.

සටහන.—(2) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ලංකා කාර්මික විද්‍යාලයයේ හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාලවල හෝ රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ හෝ වෘත්තීය සහතික දරන්නන් එම සහතිකවල ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම, ලී වැඩ හෝ ලෝහ වැඩ විවීම හෝ මැටි ශිල්පය සඳහන්ව ඇත්නම් ඉහත දී ඇති ව්‍යවස්ථාවල සඳහන් එම විෂයයන් ගෙන් නිදහස් කරනු ලැබෙත්.

(ඊ) වාණිජ පාඨමාලාව සඳහා

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

(අ) ගණකාධිකරණය සඳහා සාමාර්ථ්‍යයක් සහ පහත සඳහන් විෂයයන් ගෙන් 2ක් සඳහා සාමාර්ථ්‍යයන්—

වාණිජ අංක ගණිතය, වාණිජ විද්‍යා මූලධර්ම, ආර්ථික විද්‍යාව, ලඝුලේඛනය සහ යතුරු ලියනය (ලඝුලේඛනය සහ යතුර ලියනය එක් විෂයයක් සේ සලකනු ලැබේ).

(ආ) ගණකාධිකරණය, වාණිජ අංක ගණිතය සහ වාණිජ විද්‍යා මූලධර්ම යන විෂයයන්ගෙන් 2ක් සඳහා සම්මාන හෝ

(ii) උසස් පාඨශාලා සහතික පත්‍ර/අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී

(අ) ගණකාධිකරණය, වාණිජ්‍ය සහ මුදල් යන විෂයයන් දෙක සඳහා සාමාර්ථ්‍යය සහ

(ආ) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් එකකින් සාමාර්ථ්‍යය— වාණිජ අංක ගණිතය, ආර්ථික විද්‍යාව, ලඝු ලේඛනය සහ යතුරු ලියනය (ලඝු ලේඛනය සහ යතුරු ලියනය එක විෂයයක් සේ සළකනු ලැබේ) හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයයේ පොත් තබන්නන් සඳහා වූ වාණිජ සහතිකය හෝ ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පොත් තබන්නන් සඳහා ප්‍රදානය කරනු ලබන වාණිජ සහතිකය හෝ ලන්ඩන් වාණිජ මණ්ඩල සහතිකය (උසස් හෝ පහළ) හෝ

(iv) ලංකා කාර්මික විද්‍යාලයයේ ලඝු ලේඛක යතුරු ලියන්නන් සඳහා වාණිජ සහතිකය හෝ ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක යතුරු ලියන්නන් සඳහා සහතිකය හෝ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ සහතිකය (උසස් හෝ පහළ) සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණකාධිකරණය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් හෝ උසස් පාඨශාලා සහතිකපත්‍ර/අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගණකාධිකරණය සඳහා සාමාර්ථ්‍යයක් හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයයේ වාණිජ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවැනි වසරෙහි පැවැත්වෙන විභාගයේදී ලබාගන්නා ලද සාමාර්ථ්‍යයක්.

එෆ්. ගෘහ විද්‍යා පාඨමාලාව සඳහා

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :—

(අ) ගෘහ විද්‍යාව හෝ ගෘහ කර්මය සඳහා සම්මානයක්

(ආ) මැහුම් වැඩ හෝ ගෘහ කර්මය සඳහා සම්මානයක් (සටහන (1) බලන්න).

(ඇ) පහත දැක්වෙන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සාමාර්ථ්‍යයක්—සෞඛ්‍ය සහ ශාරීරික විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, හෝ පහත දැක්වෙන ඒවායින් එකක් :—

(1) ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය.

(2) ජ්‍යෙෂ්ඨ විභාගයෙන් පසු ගෘහ විද්‍යාව පිළිබඳ දෑවුරුදු පාඨමාලාවක් හදරා පිළිගත් ආයතනයකින් ප්‍රදානය කරන ලද ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය.

(3) කුණ්ඩසාලේ කාන්තා ගොවිකම් පාසැලෙන් කෘෂිකර්මය පිළිබඳව ප්‍රදානය කරන ලද සහතිකයක් (ගෘහ විද්‍යාව සහ මැහුම් වැඩ ඇතුළුව) හෝ දෑවුරුදු පාඨමාලාවකින් පසු ප්‍රදානය කරන ලද ග්‍රාමීය ගෘහ පාලනය පිළිබඳ සහතිකය.

සටහන.—(1) ගෘහ කර්මය සඳහා මැහුම් වැඩ ද ඇතුළත් වූ පහත සඳහන් සහතික පමණක් පිළිගනු ලැබේ.

1. 1941 සිට 1949 ජූලි දක්වා ගෘහ කර්මය/(ඉංග්‍රීසි මාධ්‍යය) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය.

2. 1940 අගෝස්තු සිට 1948 අගෝස්තු දක්වා ගෘහ කර්මය (සිංහල මාධ්‍ය) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය.

8. අංක 7 (ඒ) (iii) (ඒ) ව්‍යවස්ථාවේ අවශ්‍යතාවයන් සඳහා මෙම විභාගයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේදී රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක පිළිගත් ආචාර්‍ය මණ්ඩලයකට අයත් අය ගුරුවරුන් වශයෙන් සළකනු ලැබේ. පිළිගත් පාසලක ස්ථිර ගුරු මණ්ඩලයකට අයත් සාමාන්‍ය පන්තිවල පැය 20ක් උගන්වන ගුරුවරුන් ද, ගුරුවරුන් වශයෙන් සලකනු ලැබේ. මේ සඳහා පහත සඳහන් වර්ගවලට අයත් පාසල් පිළිගත් පාසල් සේ සලකනු ලැබේ :—

(අ) 1951 දී ගාස්තු අය කරන පාසල් බවට පත්වූ ආධාර ලබන පාසල්,

(ආ) 1960.12.1 දින සිට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත්වූ i වැනි හා ii වැනි ශ්‍රේණියේ පාසල් මෙම ගණයට අයත් ගුරුවරුන් විසින් පුහුණු වන කාල සීමාව ඇතුළත දී නව පාසල් කළමනාකරුවන් විසින් වැටුපක් හෝ දීමනාවක් ගෙවන බවට ද පුහුණු වූ පසු එම කළමනාකාරත්වය යටතේ පත්වීමක් දෙන බවට ද ප්‍රතිඥාවක් සහිත ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

9. විභාග පරිපාටිය.—(ඒ) ලිඛිත හා සම්මුඛ පරීක්ෂණය වශයෙන් මෙම විභාගය කොටස් දෙකකින් සමන්විතය. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව තෝරාගත් අය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබෙත්.

සටහන.—ඉංග්‍රීසි පාඨමාලාව සඳහා තරඟ කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් යුක්තය :—

(i) බුද්ධිපරී ක්ෂණය.—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ. ½යි. ලකුණු 100යි. සෑම අයදුම්කරුවන්ටම.

(ii) ඉංග්‍රීසි භාෂාව හා රචනය—පැ. 1½ බැගින් වූ ප්‍රශ්නපත්‍ර දෙකකි. ලකුණු 200 යි. ඉංග්‍රීසි පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට.

(iii) ගණිතය—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 2ක ප්‍රශ්න පත්‍ර දෙකකි. ලකුණු 200යි. ගණිත පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(iv) විද්‍යාව—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3යි. ප්‍රශ්නපත්‍ර දෙකයි. ලකුණු 200 යි. විද්‍යා පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(v) වාණිජ විද්‍යාව—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3යි. ප්‍රශ්නපත්‍ර දෙකයි. ලකුණු 200යි. වාණිජ පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(vi) හස්ත කර්මාන්ත—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3යි. ලකුණු 200 යි. හස්ත කර්මාන්ත පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට.

(vii) ගෘහ විද්‍යාව සහ මැහුම් වැඩ—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3 යි. ලකුණු 200යි. ගෘහවිද්‍යා පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(බී) ඉංග්‍රීසි භාෂාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණන් තැබීම, වාණිජ ශාස්ත්‍රීය මූලධර්ම පිළිබඳ නිර්දේශයන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ මෙනි. එහෙත් ඊට වඩා උසස් තත්ත්වයක ප්‍රශ්න දෙනු ලැබේ.

(i) ඉංග්‍රීසි—භාෂාව හා රචනය පිළිබඳ නියමිත පොත් නැත.

(1) වන පත්‍රය : ඉංග්‍රීසි රචනය සහ සාරාංශය—පැ 1½යි.

(2) වන පත්‍රය : ඉංග්‍රීසි භාෂාව පැ 1½ යි.

(ii) ගණිතය—I වන පත්‍රය වීජ ගණිතය හා ත්‍රිකෝණමිතිය.

II වන පත්‍රය ජ්‍යාමිතිය.

(iii) විද්‍යාව—මේ පිළිබඳ ප්‍රශ්නපත්‍රවල භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් පිළිබඳ ප්‍රශ්න දෙනු ලැබේ. සුදුසුකම් ඇති සෑම අයදුම්කරුවෙකුටම වුවමනා ප්‍රශ්න ගණනට උත්තර සැපයීමට හැකි වන පරිදි මේ ප්‍රශ්න පත්‍ර දෙකම එකවර දෙනු ලැබේ.

(iv) වාණිජ විද්‍යාව පිළිබඳ ප්‍රශ්නපත්‍රවල ගණන් තැබීම හා වාණිජ ශාස්ත්‍රීය මූලධර්ම පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ. මේ විෂයයන් දෙකෙන් එකක් පමණක් උගත් අයදුම්කරුවෙකුට වුව ද අවශ්‍ය ප්‍රශ්න ගණනට උත්තර සැපයිය හැකි වන පරිදි මේ ප්‍රශ්නපත්‍ර දෙකම එකවර දෙනු ලැබේ.

(v) හස්ත කර්මාන්ත ප්‍රශ්න පත්‍රයෙහි ලෝහ වැඩ සහ ලී වැඩ ගැන ප්‍රශ්න ඇතුළත් වේ. මින් එකක් ඉගෙන ගත් අයදුම්කරුවකුට වුවද අවශ්‍ය ප්‍රශ්න ගණනට උත්තර සැපයීමට හැකි වනු ඇත.

(vi) ගෘහ විද්‍යාව හා මැහුම් වැඩ පිළිබඳ ප්‍රශ්නපත්‍රයෙහි සූප ශාස්ත්‍රය, පෝෂණය, වස්ත්‍ර හා මැහුම් වැඩ, ගෘහ පාලනය, රෙදි සේදීම හා මාතෘ කර්මය ගැන ප්‍රශ්න ඇතුළත් වේ.

(සී) මේ ප්‍රශ්නපත්‍ර දෙනු ලබන්නේ ඒ ඒ විෂය සමග සඳහන් කළ මාධ්‍යයන්ගෙනි. ඉන් කැමති මාධ්‍යයකින් උත්තර සැපයීමට අයදුම්කරුට ඉඩ ඇත. ඉංග්‍රීසි පාඨමාලාවට පෙනී සිටින අයදුම්කරුවන් බුද්ධි පරීක්ෂණය ප්‍රශ්නපත්‍රයට උත්තර සැපයිය යුත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

10. **විභාගයට ඇතුළු කර ගැනීම.**—(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියළුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවකු එසේ ඇතුළත් කිරීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන්නේය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසු හෝ සම්මුඛ පරීක්ෂණයෙහි දී හෝ අභ්‍යාස විද්‍යාලයකට ඇතුළත් වී පුහුණුව ලබමින් සිටිය දී හෝ පුහුණුව ලැබුවායින් පසු හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ හෝ අවශ්‍ය තොරතුරු නොදී සඟවන හෝ වැරදි තොරතුරු සපයන අයදුම්කරුවකුගේ හෝ විභාග අපේක්ෂකත්වය හෝ පුහුණුව හෝ අවලංගු කරනු ලැබේ. එවැනි අයදුම්කරුවකු විසින් ලබාගත් පුහුණු සහතිකය ද අවලංගු කරනු ඇත. වංචනික ලෙස ක්‍රියාකර ඇති අයදුම්කරුවන්ට ජීවිතාන්තය දක්වා ගුරු වෘත්තියට ප්‍රවිෂ්ට වීමට අවකාශ ලැබෙන කිසියම් විභාගයකට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11. **පරීක්ෂණයට ඇතුළු වීමට ඉල්ලීම.**—(i) මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරු විසින් ම පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළු වීමට ඉල්ලුම් කළ යුතුය. සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාවකට ඇතුළු වීමට අදහස් කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් සිංහලෙන් සම්පූර්ණ කළ යුතුය. දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාවනට ඇතුළු වීමට අදහස් කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් දෙමළෙන් සම්පූර්ණ කළ යුතුය. **මුද්‍රිත අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු නොලැබේ.**

(ii) අයදුම්පත සකස් කිරීමේදී මෙහි පහත දැක්වෙන උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය. ඒවා නොසළකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂෙප කිරීමට හේතු වේ :—

(අ) ෆුල්ස්කැප් ඉරුවක, එනම් 8'' × 13'' ප්‍රමාණයේ කඩදාසියක අයදුම් පත පිළියෙළ කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදාසියක් ප්‍රයෝජනයට නොගත යුතුය.

(ආ) ටයිප්රයිටරයක් මගින් අයදුම්පත පිළියෙල කළ ද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම්පෙතහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතුය.

(ඉ) ඉරි ඇඳ අයදුම්පතේ කොටු වෙන් කරන්න. ඒවා නියමිත පිළිවෙලට තිබිය යුතුය. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු එකටෙක ගොඩ නොගැසෙන ලෙස ද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙස ද ඉතා හොඳ අන්දමින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම්පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පසුව නම් අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. පහත සඳහන් කරුණුවලට අයදුම්කරුවන්ගේ සැලකිල්ල යොමු විය යුතුය :—

(ඒ) ලියාපදිංචි කරන ලද ගුරුවරුන් ගුරුවරියන් විසින් අයදුම්පත්‍රවල භාවිත කළ යුත්තේ ලියාපදිංචි කිරීමේ දී යොදන ලද නමය. අවශේෂ අය ඔවුන්ගේ උප්පැන්න සහතිකයෙහි ඇති නම් භාවිත කිරීම නුවණට හුරුය.

(බී) සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත්‍රයෙහි තමා ගුරුවරයෙක් ද, ශිෂ්‍ය ගුරුවරයෙක් ද, ගුරුවරයෙක් නොවන්නෙක් ද යන වග සඳහන් කළ යුතුය. ගුරුවරුන් සහ ශිෂ්‍ය ගුරුවරුන් තමන්ගේ මුල් පත් වීමේ දිනය සඳහන් කළ යුතුය.

(සී) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක ගගන හෝ ගොඩ යුද්ධ හමුදවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු, හෝ එවැනි පාසලක එම තත්ත්වයේ සිට විශ්‍රාමලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාම සේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

(ඩී) ආණ්ඩුවේ හෝ අනුමත පාසල්වල ගුරුවරුන් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ පාසල් ප්‍රධානයන් මගිනි.

(iv) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970 මැයි මස 10 වැනිද ය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම ද, තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සටහන් කළ යුතුය.

(v) අයදුම්පත්‍ර ලැබුන බව දන්වා එවනු නොලැබේ.

(vi) කිසියම් ලියවිල්ලක් අයදුම්පත්‍රය සමග නොඑවිය යුතුය.

12. **විභාග ගාස්තු.**—සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රයට රුපියල් 20 ක් වටිනා මුද්දර අලවා ඒ පිට තම අත්සන හා දිනය දැමීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකර මුද්දර එවීම සම්බන්ධයෙන් කාර්‍යාලය වග කියන්නේ නැත.

13. **අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.**—(i) පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම්කරු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඒ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන්කිසි විධියකින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම්පත්‍ර,

(බී) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම්පත්‍ර.

(සී) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්‍ර.

(ii) අයදුම්පත් ප්‍රතික්ෂේප කළවිට මුද්දර ගාස්තු රාජසන්තක වේ.

14. **මුදල් ආපසු නොදීම.**—අසනීපවීම හෝ අන් කරුණක් නිසා විභාගයට පෙනී නොසිටීම ඇතුළු කිසිම කරුණක් සඳහා ගෙවන ලද මුදල් හෝ ඉන් කොටසක් ආපසු ගෙවනු නොලැබේ.

15. **ප්‍රවේශ පත්‍ර.**—(i) විභාගය පැවැත්වීමට දින හතකට පමණ පෙර පුවත්පත් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව දැනුම් දෙනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙක් ම සැලකිල්ලෙන් සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවකුට විභාගය පටන් ගන්නා දිනට යටත් පිරිසෙයින් දින 7 කට කලින් ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය : විභාග) ඒ බව නොපමාව දන්වා එවිය යුතුය. එසේ දන්වා එවීමේ දී පහත සඳහන් විස්තර ද සඳහන් කළ යුතුය:—

(ඒ) විභාගයේ නම,

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම,

(සී) සම්පූර්ණ ලිපිනය,

(ඩී) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථාන,

(ඊ) අයදුම්පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල්පොල හා රෙජිස්ටර් අංකය.

16. **හැඳින්වීමේ පත්‍ර.**—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේ දී තමන් එක් එක් විෂයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතිට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) පෝස්ට්මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card).

(බී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්ද වූද වලංගුව පවත්නා වූද " පාස්පෝට් " (Pass Port) බලපත්‍රයක්.

(ඞී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්ද වූ ද, තම ඡායාරූපය දරන්නාවූද සහතික පත්‍රයක් හෝ බල පත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්.

(ඞී) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්. එහි පිට පැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතුය. එසේ සහතික කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින්ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය......................................

(අයදුම් කරුගේ සම්පූර්ණ නම)

..............................................ගේ බවත්, පහත යොද ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත්, මම සහතික කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

————————,
සහතික කරන්නාගේ අත්සන.

————————,
නම සහ තත්ත්වය.

දිනය :————

ඉහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම් කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

**17.** ලිපි ලේඛනාදිය.—(i) පහත දැක්වෙන ලිපි ලේඛන සියල්ලක්ම හෝ ඉන් සමහරක් වුවමනා වන්නේය :—

(ඒ) ලංකාවේ පුරවැසියකු හැටියට ලියාපදිංචි කළ සහතිකය හෝ (අදාළ නම්) පුරවැසි භාවය ලැබීමට ඇති සුදුසුකම පිළිගත් බවට නිකුත් කෙරෙන රාජකාරි ලියමනෙහි මුල් පිටපත.

(බී) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය (මෙම සහතිකය නිකුත් කර නොමැති නම් බාහිර අයදුම්කරුවකු නම් ප්‍රතිඵල සටහන හෝ පාසල් අයදුම් කරුවෙකු නම් පාසල් ප්‍රධානයන්ගේ ප්‍රකාශයක් (මේ නිකුත් කළ යුත්තේ ප්‍රධානියා විසින්මය). මෙම ප්‍රකාශයෙහි සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුය. එනම් අයදුම්කරුගේ සම්පූර්ණ නම, පරීක්ෂණය, එය පැවැත්වූ මාසය හා වර්ෂය, විභාග අංකය විෂයයන් හා ප්‍රවීණතා).

(සී) ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය) (මෙය නොමැති නම් ඉහත (බී) හි අනුව ලියවිලි).

(ඩී) උප්පැන්න සහතික පත්‍රය හෝ වයස සම්බන්ධ විශේෂ සහතිකය (පාසල්වලට ඇතුල්වීම සඳහා නිකුත් කරන විශේෂ උප්පැන්න සහතිකය හෝ බෞතීස්ම සහතිකය භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් සහතික භාර ගනු නොලැබේ).

(ඊ) දිවුරුම් සහතික (වුවමනා වීටෙක නමෙහි ඇති වෙනස්කම් සඳහා ඉදිරිපත් කළ යුතුයි.) මෙම දිව්රුම් සහතික දිව්රා අත්සන් කළ යුත්තේ තම දෙමාපියන් විසින් හෝ ඔවුන් ජීවතුන් අතර නැත්නම්, වයස අවුරුදු 21 ට වැඩි කිට්ටු ඥාතිවරයකු විසින්ය. උප්පැන්න සහතික පත්‍රයෙහි නම් වෙනස් කිරීමට කටයුතු කර ගෙන යනු ඇතැයි එම දිවුරුම් සහතිකයේ සඳහන් කළ යුතුය. දිවුරුම් සහතිකය පිළියෙල කිරීම සඳහා මුද්දර වුවමනා නැත.

(එෆ්) 8 වන ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් පිළිබඳ යම් අනුග්‍රහයන් අපේක්ෂා කෙරේ නම් පාසල් හෝ පිරිවෙන් ප්‍රධානයන්ගේද වතු පාසල් පිළිබඳ නම්, සුපිරින්ටැන්ඩන්ට්ගේද සහතික, පාසලේ හෝ පිරිවෙනේ නම සහ ලිපිනයද, ගුරුවරයා දරන තනතුර පිළිබඳ සම්පූර්ණ විස්තර ද ඇතුලත් විය යුතුය.

(ජී) 8 වන ව්‍යවස්ථාව අනුව දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරු වෙත යවන ලද ප්‍රතිඵල ලේඛනය හෝ නිවේදනය. එවැන්නක් නොමැති නම් අයදුම්කරු පෙනී සිටියා වූ විභාග විස්තර සහිතව ඉල්ලීමක් කළ විට දෙපාර්තමේන්තුව විසින් ලියවිල්ලකින් කෙලින්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත විස්තර නිකුත් කරනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අභ්‍යාස විද්‍යාලය හෝ ප්‍රාදේශීය නිලධාරි කාර්‍යාලය හෝ අයදුම්කරු විසින් සඳහන් කළ යුතුය. එවැනි ලියවිල්ලක් අයදුම්කරුට දෙනු නොලැබේ.

(එච්) සැලකිය යුතු ප්‍රභුවරුන් දෙදෙනෙකුගෙන් අයදුම්කරුගේ චරිතය පිළිබඳ සහතික. එම සහතික අවුරුදු 5 කට වඩා කාලයක් අයදුම් කරු හොඳින් දන්නා අයකුගෙන් මෑත දී ගන්නා ලද්දක් විය යුතුය. පිළිගත හැකි ඉතාම හොඳ සහතික නම් තම පාසලේ ප්‍රධානයාගේ හෝ අයදුම්කරු පදිංචි නගරයෙහි හෝ ගමෙහි සිටින නිලධාරියකුගේ සහතික වේ.

(ii) සහතික හෝ ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අයදුම් පත්‍රය සමඟ නොඑවිය යුතුය. අවශ්‍ය සහතික පත්‍ර ලියවිලි ආදී සියල්ලක්ම ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් විසින් පමණක් එම පරීක්ෂණයේ දී ය.

සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍ය වූද, පිළිගත හැකි වූ ද, ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(iii) දෙන ලද උපදෙස් අනුගමනය නොකොට අයදුම් පත්‍රය සමඟ යම් ලියමනක් එවනු ලැබුවොත් එය පිළිබඳ මෙම කාර්යාලය වග නොකියයි.

(iv) මෙම ලිපි ලේඛනාදියෙහි සත්‍යතාව සම්බන්ධයෙන් අයදුම්කරු සම්පූර්ණයෙන් වග කිව යුතුය. තොරතුරු වෙනස් කරන ලද හෝ අත්සන් වෙනස් කරන ලද හෝ අසත්‍ය දේ අඩංගු කරන ලද ලිපි ලේඛනාදිය හෝ ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට තද බල දඬුවම් පමුණුවනු ලැබේ. ඔවුන්ගේ විභාගාපේක්ෂකත්වය ද අවලංගු කරනු ලැබේ.

ඔවුන්ට පරීක්ෂණයට පෙනී සිටින්නට ඇති සුදුසුකම් අවලංගුවීම සහ ගුරු වෘත්තිය සඳහා පැවැත්වෙන සියළුම පරීක්ෂණයන්ට මුළු ජීවිත කාලය තුළදීම පෙනී සිටීමට නොහැකි වීමටද සිදු වේ.

**18.** ප්‍රතිඵල.—මේ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පුහුණුවීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පෞද්ගලික වශයෙන් දැනුම් දෙනු ඇත. කායික හෝ මානසික ආබාධයන්ගෙන් පෙළෙන අයදුම්කරුවන් තෝරා ගනු ලැබීමට නුසුදුස්සන් වනවා ඇත. ප්‍රතිඵල ලේඛනයක් ප්‍රසිද්ධ කරනු නොලැබේ. විස්තර ප්‍රතිඵල ද නිකුත් කරනු නො ලැබේ. විභාග කාර්‍යාලයට ඒ ගැන ලියුම් එව්වහොත් එවාට පිළිතුරු නොලැබේ.

**19.** මෙම ව්‍යවස්ථාවන්හි අඩංගු නොවූ අන්කිසි කරුණක් වේතොත් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව විභාග කොමසාරිස්ට අභිමත ලෙස එය තීරණය කරනු ලැබේ.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පංති)—1970

විභාග අංකය :————.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

| | |
|---|---|
| 1. (අ) නම (මුලකුරු සමග) :————. (ආ) සියළුම නම් සම්පූර්ණයෙන් :——. | 2. තෝරාගත් මධ්‍යස්ථාන: පළමුවැනි තේරීම :——. දෙවෙනි තේරීම :——— |

3. උපන් දිනය :————. උපන් ස්ථානය :————.

4. ජාතිය :————.

| | |
|---|---|
| 5. පිරිමියෙක් නම් "පි" ද ගැහැණියෙක් නම් "ගැ" ද ලොකු අකුරින් ලියන්න:————. | ගුරුවරයෙක් ද, ශිෂ්‍ය ගුරුවරයෙක් ද, ගුරුවරයෙක් නොවේද යන බව සඳහන් කරන්න :————. |

6. (අ) ස්ථිර ලිපිනය :————.

(ආ) දැනට ගුරුවරයකු නම් පාසලේ ලිපිනය :————.

7. තෝරා ගත් පාඨමාලා රුචි අනුක්‍රමයෙන් :

1. ————.
2. ————.
3. ————.

8. මෙම පාඨමාලාවට ඔබේ අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ ප්‍රතිඵල :—

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |
| 7. | ———— | ———— | ———— |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල :—

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————.

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————.

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |

(ඉ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල :—

| | වර්ෂය | මාසය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— | ———— |

(ඊ) ගැසට් නිවේදනයෙහි අඩංගු අනිකුත් විභාග වලින් ඔබ සුදුසුකම් ලබා ඇත්නම් එම විභාගවල ප්‍රතිඵල :—

| | විභාගයේ නම | වසර හා මාසය | සමර්ථ වූ විෂයයන් | දරණ සහතිකයේ පෙළ සහ දිනය |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |

9. (අ) මෙම පරීක්ෂණය පිළිබඳව ගැසට් නිවේදනය අනුව මට පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවද,

(ආ) මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන ලද තොරතුරු මා දන්නා පමණින් හා විශ්වාසය අනුව සැබෑ බව ද,

(ඉ) මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නො කළ වලංගු මුද්දර බවද මම සහතික කරමි. තවද, මෙම පරීක්ෂණය පිළිබඳ ව්‍යවස්ථාවනට සහ අයදුම්කරුවන් සඳහා පනවා ඇති නියෝගයනට එකඟව ඒවායින් බැඳී සිටීමට ද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. මුද්දර කොටුව :—

**සැළකිය යුතුයි.**—රුපියල් 20ක් වටිනා මුද්දර මෙහි අලවා අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කරන්න. මුද්දර එක පිට එක ඇලවීම නො කළ යුතුය.

11. අයදුම්කරුගේ අනන්‍යතාව සහතික කිරීම :—

මෙමම අයදුම් පතෙහි නම සඳහන් අය මා හොඳාකාර අඳුනන බවද, අද දින මා ඉදිරියෙහි දී අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ නම (පැහැදිලිව) :————.

තත්ත්වය :————.

ලිපිනය :————.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එකී විෂය යකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතු ය. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළ දී විභාග ශාලාවේ කාර්‍ය්‍යමණ්ඩලයේ කෙනෙකු සමග හැර විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදිය අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදසියෙහි හැර තීන්ත පොවන කඩදසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේස මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතු ය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්ව රූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකියි.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත් පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උප කරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවල දී, ඒවා හැර අන්‍ය අත්බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, fපයිල් කවර, කාර්ඩ්බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදසියක් ම ලියමින් සිටින කඩදසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම් කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙකු කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරිහැටි දැන ගත යුතුය.

(ii) යම්කිසි විෂයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කැලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(v) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් : ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලෑජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියකවත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරිවන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුළින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබෙල්ලෙන් නොගැල වී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුයි. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ සම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

4–509—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### යාපනය උප කොට්ඨාශය

යාපනය උප කොටසේ කනගාම්බිකයි කුලමේ අතුරු ඇලවල් කැපීම සඳහා අංක 1 සිට 7 දක්වා වවුනියාව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් 1970 මැයි මස 15 වැනි සිකුරාදා පෙරවරු 10 සිට ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. රුපියල් 24,800 කට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති පමණක් මෙම කාර්යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. 1970 මැයි මස 11 වැනි දින පස්වරු 3 තෙක් කාර්යාල වේලාවන් තුළ යාපනය කච්චේරිය, යාපනය උප කොටස වවුනියාව/මුල්ලතිවු/වවුනිකුලම/මන්නාරම යන වාරිමාර්ග කාර්යාලවලින් එයට අදාල හිස් ෆෝර්මද ලබාගත හැක. ටෙන්ඩර්පත් පිළියෙල කිරීමට පෙර ටෙන්ඩර්කරුවන් ස්වකීය ලියාපදිංචි පොත් සහ දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ දීමට සුදුසුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදල් යථෝක්ත ඕනෑම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයක හෝ එම මුදල කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමද සෑහේ.

4. මේ සම්බන්ධ වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී, කිලිනොච්චියේ පිහිටි යාපනය උප කොටස වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොටස.

කිලිනොච්චිය,
1970 අප්‍රේල් මස 3 වනදා.

4–483—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතර උප කොටස

තංගල්ලේ දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 මැයි මස 11 වැනි සඳුදා පෙරවරු 10 දක්වා මාතර උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ :—

| | වැඩ විස්තර | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| 1. | වල්පොල කණිෂ්ඨ නිළධාරි නිවාසයක් තැනීම ... ... ... ... | 27,000 | 0 ... | 50 | 0 |
| 2. | කිරලකැලේ දිය බස්නා ව්‍යාපාරයේ ආර්. 4, පාලකයක් තැනීම (රෙගියුලේටරයක්) ... ... | 31,000 | 0 ... | 50 | 0 |
| 3. | කිරලකැලේ දිය බස්නා ව්‍යාපාරයේ ආර් 6, පාලකයක් තැනීම (රෙගියුලේටරයක්) ... ... ... | 27,000 | 0 ... | 50 | 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දැක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 මැයි මස 8 වෙනි සිකුරාදා සවස 4 දක්වා මාතර, ගාල්ල, හම්බන්තොට සහ තිස්ස උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලයන් ගෙන් කාර්යාල වේලාවන් තුල දී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉදිරිපත් වෙන ටෙන්ඩර් කරුවන්හට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ එම වැඩවල වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර, එම වැඩ සඳහා ඉහත දැක්වෙන අයුරු ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාල වල තැන්පත් කළ යුතුයි. නැතහොත් නියමිත ටෙන්ඩර් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය 1970 මැයි මස 8 වැනිදාට පෙර කාර්යාල වේලාවන් තුල දී යටකී ඉංජිනේරුවරුන් වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර මාතර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුල දී ලබා ගත හැක.

එච්. ඩී. සී. ගුණවර්ධන,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතර උප කොටස.

1970 අප්‍රේල් මස 3 වැනි දින,
වාරිමාග කාර්යාලය,
පඹුරන, මාතර,

4–485—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහවැලි ගඟ යෝජනාක්‍රමය යටතේ පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර්පත්, මහවැලි ගඟ සංවර්ධන යෝජනාක්‍රමයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 මැයි මස 3 වෙනි ඉරිදා පෙරවරු 10 දක්වා පොල්ගොල්ලේ පිහිටි ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලයේදී භාරගනු ලැබේ :—

| | වැඩ විස්තරය | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| 1. | නාඋල, ජ්‍යෙෂ්ඨ කාර්මික සහායකවරුන්ගේ අංක 1 ස්ථිර ගොඩනැගිල්ල ඉදිකිරීම ... ... ... | 31,000 | ... | 50 | 0 |
| 2. | නාඋල, ජ්‍යෙෂ්ඨ කාර්මික සහායකවරුන්ගේ අංක 2 ස්ථිර ගොඩනැගිල්ල ඉදිකිරීම ... ... | 31,000 | ... | 50 | 0 |

2. 1970 අප්‍රේල් මස 30 වෙනි දා (එදිනද) ඇතුළුව කාර්යාල වේලාව තුලදී මහවැලි සංවර්ධන යෝජනාක්‍රමය, බෝවතැන්න/පොල්ගොල්ල/උකුවෙල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට භාරගෙන ඇති වැඩත් ඒවායේ වටිනාකමත් දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දැක්වෙන පිලිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් පොල්ගොල්ලේ වාරිමාග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් ගැන සියළුම විස්තර කාර්යාල වේලාවන් තුල දී නාඋල පිහිටි බෝවතැන්න වාරිමාග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇල්. යූ. වීරකෝන්,
වාරිමාග ඉංජිනේරු,
මහවැලි යෝජනා ක්‍රමය,
බෝවතැන්න.

වාරිමාග කාර්යාලය,
බෝවතැන්න, නාඋල,
1970, අප්‍රේල් 4.

4–478—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ලබුදූව හා මාපලාන ගොවිපලවලට පහත සඳහන් ඉඳුණු, වල් අඹ හෝ කොහු අඹ ප්‍රමාණයන් සැපයීම සඳහා 1970.5.14 දින පස්වරු 2.30 දක්වා මිල ගණන් පත්, මාතර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

(අ) මාපලාන ගොවිපලට අඹ ගෙඩි 25,000.

(ආ) ලබුදූව ගොවිපලට අඹ ගෙඩි 50,000.

2. ටෙන්ඩර් පෝරම මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගෙන් ලබාගෙන ඒවා යේ ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා, එහි මුදුන් වම් කොනේ "මාපලාන හා ලබුදූව ගොවිපල වලට ඉඳුණු අඹ සැපයීම" යන්න ලියා, මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමිත දිනට පෙර දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. පෝරම නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම, ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටා ඇති ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම බාරදිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත් ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවනට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගෙන් වහාම විමසිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර් බාරගැනීම නැවැත්වීමට නියමිත වේලාවේදී මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ඇත.

6. නියමිත පෝරමයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය නිවැරදිව පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවා වූ ද, දේවල මූළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ නමින් තැන්පත් කිරීමට හා පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙත වාද ඇත.

9. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරින්.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරේව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත්වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධත්වය පළ කරන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14 වැඩි විස්තර මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් හා මාපලාන හෝ ලබුදූව රජයේ ගොවිපල කළමනාකරුගෙන් ද දැනගත හැකිය.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1970. අප්‍රේල් මස 4 දින,
පේරාදෙණියේදී ය.

4–482—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 8, මැගසින් පාරේ පිහිටි බේකරියට පාන් එතීම සඳහා සුදුසු "ඔප් කට්" පුවත් පත් කඩදාසි 1970.9.30 න් අවසන් වන කාලය සඳහා (මසකට හොණ්ඩර 30 බැගින්) සැපයීමට මිල ගණන් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 7 වැනි දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

මිළ ගණන් පෝරම හා වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. මිළ ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

අ. වි. ර. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 අප්‍රේල් 7 දින,
කොළඹ 1,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

4–460—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

ජාතික පොලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මහජන වෙළඳ හලට අවු. 1, අවු. 2, අවු. 4 සහ රා. ½, රා. 1 යන ප්‍රමාණයන්ගේ මිරිස් කුඩු ආදිය ඇහිරීම සඳහා එක් පාටකින් මුද්‍රණය කරන ලද ගේජ් 400 යේ නල හැඩයේ රීල් වශයෙන් සැපයිය යුතු පොලිතින් බෑග් 2,65,000 ක් සැපයීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 8 වෙනි සිකුරාදා අ. භා. 2.30 දක්වා මිළ ගණන් භාරගනු ලැබේ.

මිළ ගණන් පෝරම සහ වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. ඩබ්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 4. 7 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

4–507—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

උස අඩි 3 තේ සිට අඩි 4 දක්වාවූ මැහොගනි පැල තුන් ලක්ෂ පනස් දහසක් (3,50,000) පමණ කුරුණෑගල වයඹ වන දිසාවේ වන යත් තුළ සිට ගාලු, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි වගා ස්ථානයන්ට ලොරිවලින් ප්‍රවාහණය කිරීම සහ දෙනියාය, කෑට්ටව සහ කඹුරුපිටිය ඔලියගන්කැලේ තවාන්වල ඇති 9″×9″ සහ 9″×6″ පොලිතීන් මලුවල පැල කරන ලද පැල, ගාලු සහ මාතර දිස්ත්‍රික්කයන්හි වගා ස්ථානයන්ට ප්‍රවාහණය කර දීම සඳහා ගාල්ලේ දකුණු දිසා වන නිලධාරී විසින් 1970.4.24 වැනි සිකුරාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉල්ලුම් කළ යුත්තේ 1970.4.23 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 12 දක්වා ගාල්ලේ දකුණු දිසා වන නිලධාරී විසින් නිකුත් කරනු ලබන පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් ආකෘතිපත් මගින් ය. රු. 100 ක් ගාල්ලේ දිසාපති කාර්යාලයේ ,දකුණු දිසා වන නිලධාරී නමින් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත් ලබා ගත හැක.

තවත් විස්තර වුවමනා නම් ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි කාර්යාලයෙන් ලබා ගත හැක.

එස්. මයිල්වාගනම්,
දකුණු දිසා වන නිලධාරී.

දකුණු දිසා වන නිලධාරි කාර්යාලය,
ගාල්ල.

4–488—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැක්ලම් පාරේ) පිහිටි ප්‍රවාහණ අංශයේ ඇති පාවිච්චි කළ මෝටර් රථ කොටස් මිළදී ඉවත්කරගෙන යාම සඳහා ටෙන්ඩර් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 9 දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක මුදලක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන්, 1970 මැයි මස 9 දින දවල් 12 දක්වා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ප්‍රවාහණ අංශයෙන් ලබාගත හැක.

ආර්. ඇෆ්. සී. ද ලිවේරා,
අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.4.7 දින,
කොළඹ 1,
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව.

4–560—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මැයි මස 8 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| 1. කු/අලව්ව මහා විද්‍යාලය ... | විද්‍යාගාරය |
| 2. කු/දිගල්ල මහා විද්‍යාලය ... | විද්‍යාගාරය |
| 3. කු/බමුණුකොටුව මහා විද්‍යාලය | විද්‍යාගාරය |
| 4. කු/කළුගමුව මහා විද්‍යාලය ... | විද්‍යාගාරය |
| 5. කු/මහඇඹෝගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල |
| 6. කු/පාලුකඩවල කොළණී විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල |
| 7. කු/බැමිණිගල්ල විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල |

සංලක්ෂය : කු/කුරුණෑගල දිස්ත්‍රික්කය.

කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 සිට 4 දක්වා රු. 40,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 5 සිට 7 දක්වා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 මැයි මස 7 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත්කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍ර වල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විසතර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාර ගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1970 මැයි මස 8 වැනි දා පෙරවරු 10.30 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතු.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේ දී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. එස්. කළුගම්පිටිය,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
කුරුණෑගල,

1970 අප්‍රේල් මස 4 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

4–484—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970. 4. 27 වැනි දින දහවල් 11.30 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

වට්ටකන්ඩල් ප්‍රවේශ පාර.

2. මෙම වැඩය සඳහා 1970. 4. 26 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරණ ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිතිවලින් මෙම ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම් කරණ විටදී, ඉල්ලුම් කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය.

3. 1970. 4. 27 දින පූ. භා. 11.30 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපිකවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ වට්ටකන්ඩල් ප්‍රවේශ පාර සෑදීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බලනු නොලැබේ.

4. 1970. 4. 27 දින පූ. භා. 11.30 ට ටෙන්ඩර් විවෘත කරණු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරණු ලබන මුදලින් සියයට 2 ක් (2%) සතුටුදායක ලෙස නිමකිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරණ තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට මෙසේ දැනුම් දී දින 10 ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජ සන්තක කරණු ලැබේ.

6. නියම කරණ ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත 5 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතුටුදායක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙවනු ලැබේ.

එන්. වෛද්‍යාරණීය සෙගොන්,
උප දිසාපති.

1970. 4. 31 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

4–470/1—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970. 4. 27 වැනි දින දහවල් 11.30 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

තාමරෙයිකුලම්-මිනිකන් ප්‍රවේශ පාර, 'බී' අදියර III කොටස.

2. මෙම වැඩය සඳහා 1970. 4. 26 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරණ ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිතිවලින් මෙම ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම් කරණ විටදී, ඉල්ලුම් කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය.

3. 1970. 4. 27 දින පූ. භා 11.30 ට පෙර මන්නාම දිසාපති වෙත ලිපිකවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ තාමරෙයිකුලම්-මිනිකන් ප්‍රවේශ පාර සෑදීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බලනු නො ලැබේ.

4. 1970. 4. 27 දින පූ. භා. 11.30 ට ටෙන්ඩර් විවෘත කරණු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරණු ලබන මුදලින් සියයට 2 ක් (2%) සතුටුදායක ලෙස නිමකිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරණ තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට මෙසේ දැනුම් දී දින 10 ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජ සන්තක කරණු ලැබේ.

6. නියම කරණ ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත 5 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතුටුදායක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙවනු ලැබේ.

එන්. වෛද්‍යාරණීය සෙගොන්,
උප දිසාපති.

1970. 4. 3 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

4–470/2—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුල, මලිදූව-කොහුගොඩ පාරේ පළමු සැතපුම් භාගය

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් තිස් දෙදහසකට (32,000) කට හෝ ඊට වැඩි වැඩ වෙනුවෙන් ප්‍ර. වැ. දෙ., වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක ලියා පදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් සහ සමුපකාර කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සිල් තබා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. නොඑසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර්පත්‍රය බහාලන ලියුම්කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "මලිදූව-කොහුගොඩ පාරේ පළමු සැතපුම් භාගය-මාතර" සඳහා වූ ටෙන්ඩර් යයි ලියා 70.5.8 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර්පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

5. 70.4.30 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර්පත්‍රයේ කරනු ලැබූ මැකීම් කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර් කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුල නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාවේ දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධසේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

11. ටෙන්ඩර් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාරගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. ඩබ්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970. 4. 5 දින,
මාතර කච්චේරියේදීය.

4–548—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුළ දැරංග, දංගල හා කළුබෝවිටියන ජනපදවල ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් නිවාස අළුත්වැඩියා කිරීම

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් පන්දහස (රු. 5,000) කට හෝ ඊට වැඩි වැඩ වෙනුවෙන් ප්‍ර. වැ. දෙ., වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක ලියා පදිංචිව ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ ලියාපදිංචි සමුපකාර කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සිල් තබා මාතර දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "ඉ. කො. දෙ. ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 1970. 5. 8 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර්පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ටද එම වේලාවේදී පැමිණ සිසිය හැක.

4. 1970. 4. 30 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර්පත්‍රයේ කරනු ලැබූ මැකීම් කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

7 තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

8. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර්කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුල නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාවේ දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධසේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

10. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාරගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

11. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. ඩබ්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට,

1970. 4. 5 දින,
මාතර කච්චේරියේදීය.

4–547—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුල, දංදෙනිය-කැන්දගහහේන පාර බෝක්කු තැනීම

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් එකොළොස් දහස (රු. 11,000) කට හෝ ඊට වැඩි වැඩ වෙනුවෙන් ර. වැ. දෙ. වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් සහ සමූපකාර කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සීල් තබා, මාතර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙලව රෙහි " දංදෙනිය-කැන්දගහහේන පාර බෝක්කු තැනීම " සඳහා වූ ටෙන්ඩර් යයි ලියා 70. 5. 8 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

4. 70. 4. 30 වැනි දින දවල් 12.00 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම් කපුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

7. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන් පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

8. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර් කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනිත් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුල නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

10. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

11. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. ඩබ්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970. 4. 5 දින,
මාතර කච්චේරියේ දීය.

4–546—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### රත්නපුරය, මහනුවර, බදුල්ල, මාතර, අනුරාධපුරය හා යාපනය ප්‍රදේශවල කැලෑවලින් දැව සැපයීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දැව සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකාර අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ**

2. (අ) **රු. 1,00,000 ට වැඩි වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා.**
මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 1,00,000 වටිනාකමට දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ආ) **රු. 50,000 ට වැඩි හා රු. 1,00,000 අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා.**
මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි, දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 50,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අය.

(ඇ) **රු. 30,000 ට වැඩි හා රු. 50,000 අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා.**
මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 30,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ඇ) **රු. 30,000 ට අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා.**
පළමුවෙනි, දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා ටෙන්ඩරයේ දැක්වෙන වටිනාකමට පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

3. මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීමට සහ අනවශ්‍ය **දැව ටෙන්ඩර් දැන්වීමේ විග්‍රහකර ඇති මිළට මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්.**

(1) **මහනුවර ප්‍රදේශය.**
(අ) එරාළුල වැඩබිම.
කඳන් සැපයීම—රු. 20,000 වටිනාකමට.
(ආ) දෙහිගහ ඇල.
කඳන් සැපයීම—රු. 7,000 වටිනාකමට.
(ඇ) මැදළුල් පොත.
කඳන් සැපයීම—ෑ. 10,000 වරටිනාකමට.
(ඈ) ගන්තොරුව වගාව.
ඉරූ ලී සැපයීම—රු. 5,000 වටිනාකමට.

(2) **අනුරාධපුර ප්‍රදේශය**
(අ) කඩවල වැව 1.
කඳන් සැපයීම—රු. 50,000 වටිනාකමට.

(3) **බදුල්ල ප්‍රදේශය**
(අ) දඹගම ජලාශ යෝජනා ක්‍රමය.
කඳන් හා දර සැපයීම—රු. 30,000 වටිනාකමට.

(4) **රත්නපුර ප්‍රදේශය**
(අ) මාවරකන්ද මූකලාන.
කඳන් හා සිල්පර සැපයීම—රු. 25,000 වටිනාකමට.

4. **මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීම සඳහා ටෙන්ඩර්.**

(1) **බදුල්ල ප්‍රදේශය**
(අ) මහඔය අම්පාර මාර්ගය.
නැවත වන වගාකරන ප්‍රදේශයන් දැව සැපයීම—රු. 20,000 වටිනාකමට.
(ආ) රඹුක්කන්ඔය ජලාශ යෝජනා ක්‍රමය.
කඳන් සිරිපර හා ඉරූ ලී සැපයීම—රු. 30,000 වටිනාකමට.

(2) **මාතර ප්‍රදේශය**
(අ) දියදාව අංක 17.
කඳන්, සිල්පර හා ඉරූ ලී සැපයීම—රු. 75,000 වටිනාකමට.

(3) **යාපනය ප්‍රදේශය**
(අ) මුරන්ඩි කුලම්-ඉයන්කුලම්.
කඳන් සැපයීම—රු. 1,00,000 වටිනාකමට.

5. 70.5.2 වැනි දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

6. 70.5.3 වැනි දින පූ. භා. 11 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකාර වරුන්ගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. බී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1970 අප්‍රේල් මස 17 වැනි දින,
රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී කළමනාකාර අංශය,
265, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

4–564—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ටෙන්ඩර් ප්‍රතිඵල

### ගුදිරි හා බ්‍රිස්ටල් කොහු කෙඳි සැපයීමේ ටෙන්ඩරය—පිය වූ දිනය : 1969.9.9

| දිනය | සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| 70.2.7 ... | (1) හොඳට පවිත්‍ර කළ සම්පූර්ණ වියළි (ලෙලි රහිත) මෙට්ටවලට සුදුසු කොහු | 4 ... | ඇම්. ඩී. චාර්ල්ස් මහතා | රු. 18.90 හොණ්ඩරයක් |
| | (2) හොඳට පවිත්‍රකළ සම්පූර්ණ වියළි ලෙලි රහිත නො. 1 වර්ගයේ පිරපු කොහු | | කුඩා බුත්ගමුව අංගොඩ | රු. 35.00 හොණ්ඩරයක් |

4-464/1—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

### මෙරට සැදූ පොලොව ඔප කරන ද්‍රව්‍ය සැපයීම—පියවූ දිනය 1969.6.17

| දිනය | සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| 70.3.2 ... | (1) මෙරට සැදූ ඉටි පොලව ඔප ද්‍රව්‍ය, රාත්තල් 2 ටින්වලින් රතු | ... — ... | සී/ස. බ්‍රවුන් සහ සමාගම | රු. 1.30 රාත්තලක් |
| | (2) එම කළු | ... — ... | සී/ස. බ්‍රවුන් සහ සමාගම | රු. 1.37 රාත්තලක් |
| | (3) එම දුඹුරු | ... — ... | සී/ස. බ්‍රවුන් සහ සමාගම | රු. 1.37 රාත්තලක් |
| | (4) එම කොළ | ... — ... | සී/ස. බ්‍රවුන් සහ සමාගම | රු. 1.37 රාත්තලක් |
| | (5) මෙරට සැදූ පාට රහිත, පොලොව සහ ලී භාණ්ඩ ඔප දැමීමේ ඉටි ද්‍රව්‍ය රාත්තල් 2 ටින් වලින් | — ... | මැනුපැක්චරස් ඇන්ඩ් මාර්කටර්ස් සින්ඩිකේට් | රු. 1.33 රාත්තලක් |

1970 අප්‍රේල් මස 17 දින,
කොළඹදීය.

සැ. ම. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

4-464/2—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## පාවිච්චියට ගත නොහැකි බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

වර්ෂ 1970 අප්‍රේල් මස 18 වැනි දින පෙ. ව. 10 ට වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ ඇති පාවිච්චියට ගත නොහැකි මේස, බංකු, වඩු ආයුද, රේක්ක, බවුන්, ඇලිපිහිය, විදුලි පන්දම්, ලෑන් තැරුම්, වීල් බැරෝ, බයිසිකල්, මුළුතැන්ගෙයි උපකරණ, වතුර ඩ්‍රම්, උදළු සහ තවත් බඩු බාහිරාදිය රාශියක් එම විද්‍යාල භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එසේ විකුණනු ලබන එක් එක් භාණ්ඩයන් සඳහා මුදල් එවෙලේම ගෙවා වෙන්දේසිය අවසන් වූ වහාම බඩු ඉවත් කර ගත යුතුයි.

ඊ. සී. ප්‍රේමතිලක,
අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය.

වතුපිටිවල,
70.3.19.

4-462—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## සේවයට නුසුදුසු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 4 ශ්‍රී 9213 දරන ඔස්ටින් 1800 වර්ගයේ මෝටර් රථය, 1970 අප්‍රේල් මස 25 දින සවස 2.30 ට, කොළඹ 15, fපර්ගියුසන් පාරේ අංක 346 දරණ ස්ථානයේ පිහිටි "ටෝරිබේ ගබඩාවේ" දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත සඳහන් රථය 1970 අප්‍රේල් මස 22, 23, 24 යන දිනයන්හි සහ 25 දින උදය වරුවේ වෙන්දේසිය පවත්වනු ලබන ස්ථානයේ දී පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසිය අවසන් වූ වහාම වටිනාකම මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගත් රථය ඉවත් කරගෙන යා යුතුය.

ආර්. ලීලාරත්න,
ස්ථිර ලේකම් වෙනුවට.

1970. 4. 8 දින,
කොළඹ 3, ගෝල්ෆේස් කෝට් හි,
වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ දීය.

4-558—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම්

මඩුරෝඩ් අඩවියේ ඇති සනඅඩි 69.2 යුත් 1 වැනි පංතියේ ඉරු දැව කැලි 124 ද, සනඅඩි 177.4 යුත් 1 වැනි පංතියේ කඳන් 15ද, 1 වැනි පංතියේ කනු 9 ද, වවුනියා දිසාවේ දිසා වන නිලධාරී විසින් 1970.4.25 දින පෙ. ව. 10 ට මඩුරෝඩ් අඩවි වන කාර්යාලයේදී වෙන්දේසි කරනු ලැබේ.

වෙන්දේසි දිනට ප්‍රථම මෙම දැව පරීක්ෂා කර බලන ලෙස වෙන්දේසියෙන් දැව ඉල්ලීමට අපේක්ෂා කරන අයගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර මෙහි පහත අත්සන් කර ඇති අයගෙන් හෝ මඩුරෝඩ් අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැකිය.

ඇම්. රත්වත්ත,
දිසා වන නිලධාරී, වවුනියාව.

දිසා වන කාර්යාලය,
වවුනියාව,
1970. 3. 31.

4-543—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද ධීවර ආම්පන්න වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද ධීවර ආම්පන්න වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ.ව. 9.30 ට සිදු කරනු ලැබේ.

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි දී මෙම ආම්පන්න පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දැක්වෙන පරිදි මුදලින් ම කළ යුතුය :—

(අ) ආම්පන්නවල විකුණුම් මිළෙන් ¼ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකිණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළත දී ; මෙම මුදල නොගෙව්වොත් ¼ තැන්පත් මුදල අවලංගු වූවා සේ සලකනු ඇත.

4. වෙන්දේසියේ විකුණන ලද ආම්පන්න මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමියෙහි ම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ආම්පන්නවල විස්තර | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| — | විදුරු බෝයා 15 | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, ත්‍රිකුණාමලය | 70.5.23 |
| | උණ බම්බු කොඩි ගස් 23 | එම | |
| | මරුවැල් මිටියක් | එම | |
| | යකඩ බෝයා 25 | එම | |
| | අදින දැල් මිටියක් | එම | |
| | පුනෝලයක් | එම | |
| | තංගුස් | එම | |
| එස් 31 | තංගුස් | එම | |
| ටී 289 | මරුවැල් මිටි 3 | ධීවර කාර්යාලය, වැලිගම | 70.5.24 |
| | විදුරු බෝයා 3 | ධීවර කාර්යාලය, හම්බන්තොට | 70.5.30 |
| | මරුවැල් කැලි 5 | එම | |
| | නැංගුරමක් | එම | |
| | 6'' නයිලෝන් දැල් කැලි 5 | ධීවර කාර්යාලය, යාපනය | 70.5.31 |
| | 4½'' ලී ඉපිලි සහිත නයිලෝන් දැල් කැලි 4 | ධීවර කාර්යාලය, කයිට්ස් | 70.6. 1 |
| ජීඕඩීබී 6 | 4½'' නයිලෝන් දැල් 372×9 යාර | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, මඩකලපුව | 70.6. 2 |
| | 5'' නයිලෝන් දැල් 45×9 යාර | එම | |
| | 4'' නයිලෝන් දැල් 63×9 යාර | එම | |
| | 3½'' නයිලෝන් දැල් 87×9 යාර | එම | |
| | මායාවලෙයි නයිලෝන් දැල් | තොගය පිටින්ම විකිණීමටයි | |
| | ලී ඉපිලි 20 | එම | |
| | ඉරුණු දැල් කැලි මිටි 1 | එම | |
| | 3½'' නයිලෝන් දැල් කැලි 1 | ධීවර කාර්යාලය, කල්පිටිය | 70.6. 6 |
| | 5'' නයිලෝන් දැල් කැලි 1 | එම | |
| | 5'' නයිලෝන් දැල් කැලි 1 | එම | |
| | 5½'' නයිලෝන් දැල් කැලි 2 (''ඒ'' අක්ෂරයෙන් ලකුණුකොට ඇත) | ධීවර කාර්යාලය, හලාවත | 70.6. 5 |
| | නයිලෝන් දැල් මිටි 1 (''බී'' අක්ෂරයෙන් ලකුණුකොට ඇත) | එම | |
| ටී 367 | සංයෝගික ඉපිලි 25 | ධීවර කාර්යාලය, දොඩන්දූව | 70.6. 3 |
| | බිලී කොකු 48 | එම | |
| | තංගුස් | එම | |
| | ආවරණ සහිත විදුරු බෝයා 2 | එම | |
| | බෝයා ආවරණයක් | එම | |
| | කුරලෝන් ලණු බඹ 21 | එම | |
| | කුරලෝන් ලණු බඹ 333 | එම | |
| ටී 165 | කුරලෝන් ලණු මිටි 5 | එම | |
| ටී 175 | කුරලෝන් ලණු මිටි 2 | එම | |
| ටී 389 | කොකු සමග කුරලෝන් ලණු අඩි 1,970 | එම | |
| | ආවරණ සහිත විදුරු බෝයා 2 | එම | |
| ටී. 346 | තංගුස් මි.මී. 3 අඩි 250 | ධීවර කාර්යාලය, කළුතර | 70.6. 7 |
| | තංගුස් මි.මී. 2 | එම | |
| | ආවරණ සහිත විදුරු බෝයා 1 | එම | |
| විජේ 9 | වෙළුම් 3'' 6 නයිලෝන් දැලක් යාර 200 | එම | |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 8 වෙනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

4–542—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

# තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## රා රේන්ද විකිණීම—මඩකලපු දිස්ත්‍රික්කය, 1970–71

1970 ජුලි මස 1 දින සිට 1971 ජූනි මස 30 වෙනි දින දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1970 මාර්තු මස 20 වෙනි දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1970–71 වර්ෂය සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව පහත සඳහන් ප්‍රදේශයන්හි පැසුණු රා විකිණීමේ තනි අයිතිය මිළදී ගැනීම සඳහා මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් දින සහ වේලාවන් දක්වා මෙම දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන් මෙම දිසාපති කාර්යාලයට පැමිණිය යුතුය.

2. අංක 3 දරණ ආරයිපත්තේ රා තැබෑරුම සඳහා රු. 1,000 කට ද, අනික් සියළු රා තැබෑරුම් සඳහා රු. 500 කටද, එක් එක් ටෙන්ඩර් පත්‍ර වෙනුවෙන් මුදල් තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කොට, ඕනෑම දිසාපති කාර්යාලයකින්, කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන්, ත්‍රිකුණාමල සහකාර සුරාබදු කොමසාරිස්ගෙන් සහ මඩකලපු සුරාබදු අධිකාරිගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. 1970 මාර්තු 20 වෙනි දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කොට ඇති 1970–71 වර්ෂය සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසිවල අංක 4 (3) (1) දරණ කොන්දේසිය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කරන ටෙන්ඩර්කරුවන් සෑම ටෙන්ඩර් පත්‍රයකටම වටිනාකමේ සහතිකයක් ඇමිණිය යුතුය.

4. මීළඟ රේන්ද කාලය තුළදී දැනට තැබෑරුම් පවතින ස්ථානම පාවිච්චිය සඳහා ප්‍රයෝජනයට ගත හැකි වේ යයි සහතික කළ නො හැක.

5. වැඩි විස්තර මඩකලපුවේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකිය.

1970 අප්‍රියෙල් මස 4 වැනි දින,
මඩකලපුව දිසාපති කාර්යාලයේ දී ය.

එඩ්ගාර් ප්‍රනාන්දු,
මඩකලපු දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

### සඳහන් කරන ලද ප්‍රදේශය

| රා තැබෑරුම් අංකය | කොට්ඨාශය | (තැබෑරුම් පිහිටිය යුතු) ප්‍රාදේශීය කොටස | ටෙන්ඩර් අවසාන වීම — දිනය | ටෙන්ඩර් අවසාන වීම — වේලාව |
|---|---|---|---|---|
| 1 | ඒරාවූර් පත්තුව | ආරුමුගතාන්කුඩිඉරුප්පුගම ඇතුලත | 1970 මැයි 17 | පෙ.ව. 10.00 |
| 2 | මඩකලපුව නගර සහා ප්‍රදේශය | මඩකලපු නගර සභාවේ 7 වැනි ආසනය තුල | 1970 මැයි 17 | පෙ.ව. 10.30 |
| 3 | මන්මුනෙයි පත්තුව උතුර | ආරෙයිපත්තු ගම තුල | 1970 මැයි 17 | පෙ.ව. 11.00 |
| 4 | මන්මුනෙයි දකුණ හා එරුවිල් පෝරතිව් පත්තුව | මාන්‍රකාඩු ගම ඇතුලත | 1970 මැයි 17 | පෙ.ව. 11.30 |
| 5 | මන්මුනෙයි දකුණ හා එරුවිල් පෝරතිව් පත්තුව | කෝඩ්ඩ කල්ලාර් ගම ඇතුලත | 1970 මැයි 17 | පෙ.ව. 12.00 |
| 6 | මන්මුනෙයි දකුණ හා එරුවිල් පෝරතිව් පත්තුව | එරුවිල් ගම ඇතුලත | 1970 මැයි 17 | ප.ව. 12.30 |

සැ.යු.—මඩකලපුව දිස්ත්‍රික්කයේ සෑම රා තැබෑරුමක්ම දිනපතා පූ.භා. 8.00 ට විවෘත කර අ.භා. 7.00 ට වැසිය යුතුය. අංක 2 දරණ කෝඩ්ඩමුනෙයි රා තැබෑරුම පමණක් අ.භා. 7.30 ට සෑම දිනම වැසිය යුතුයි.

4–492—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

## වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1970 ජුලි මස 1 සිට 1971 ජූනි මස 30 දින දක්වා කාලය සඳහා

1970 ජුලි මස 1 සිට 1971 ජූනි මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍ර යන්ට අදාළ පොදු කොන්දේසි මාලාවට යටත්ව අංක 14,898 හා 1970.3.20 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර පත්‍ර " 1970/71 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය " සී සඳහන් කර 1970.5.15 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටැන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකව සාමූහිකව ටැන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටැන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටැන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණිය හොත්,

(ආ) සෑම ටැන්ඩර් පත්‍රයකටම ටැන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරනලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තා වූද, ටෙන්ඩරයේ දැක්වෙන මුල් ප්‍රමාණයෙන් සියේට 25කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තා වූද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර් කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරණ සහතික පිට පත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ, වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමඟ ම රුපියල් 1,000 කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සිය එම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර් ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමිවූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවූවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රා රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපතිතුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වා ගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපති තුමාට දන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

## උපලේඛණය

| අංකය හා ප්‍රදේශය | | තැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව |
|---|---|---|---|---|
| 1. මුලතිවු | ... | මුලතිව් සුළු නගර සභාව | ... | පෙ. ව. 10.00 |
| 3. මුල්ලියවලෙයි | ... | මුල්ලියවලෙයි ගම් සභාව | ... | පෙ. ව. 10.30 |
| 4. පුතුකුඩිඉරුප්පු | ... | පුතුකුඩිඉරුප්පු ගම් සභාව | ... | පෙ. ව. 10.30 |
| 5. පුදුමාතලන් | ... | පුදුමාතලන් ග්‍රාමය | ... | පෙ. ව. 10.45 |
| 7. වවුනියාව | ... | වවුනියාව නගර සභාව | ... | පෙ. ව. 11.00 |
| 8. කච්චිලාමඩු | ... | කච්චිලාමඩු ග්‍රාමය | ... | පෙ. ව. 11.15 |
| 9. වට්ටුවාගල් | ... | වට්ටුවාගල් ග්‍රාමය | ... | පෙ. ව. 11.30 |

1970 අප්‍රේල් මස
වවුනියාව දිසාපති කාර්යාලයේදීය.

බී. සී. පෙරේරා,
වවුනියාවේ දිසාපති.

4-566—70.4.17 දින අංක 14,902 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## රජයේ ප්‍රකාශන කාර්යාංශය වසා තැබීම

රජයේ ප්‍රකාශන කාර්යාංශය සහ කොළඹ මහතැපැල් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ශාඛා කවුන්ටරයද වාර්ෂික ගණන් ගැනීම සඳහා 1970 අප්‍රේල් මස 7 වැනි දින සිට 20 වැනි දින දක්වා වසා තබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එහෙත් ගැසට් පත් හා මැතිවරණයට අදාළ ප්‍රකාශන මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි කවුන්ටරයෙන් පමණක් විකිණීමට විශේෂ විධිවිධාන යොදා ඇත.

ඇස්. ඇල්. බී. අමුණුගම,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

කොළඹ 1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
1970 අප්‍රේල් මස 4 වැනි දින,

4-490—70.4.17 අංක 14,902 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සදහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සදහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සදහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සදහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | .. | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද | ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | ... | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි .. | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.